SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2020 ජනවාරි

# යෝජිත උත්තර

# විෂය අංක (AA25)

# ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම

# (BLE)


ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669



මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

## AA2 විභාගය - 2020 ජනවාරි
## (AA25) ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම

## යෝජිත උත්තර

**A කොටස**

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

අනිවාර්ය ප්‍රශ්න දහයකි. (10)

(මුළු ලකුණු 20)

### 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්නය | උත්තරය |
|---|---|
| 1.1 | (2) |
| 1.2 | (4) |
| 1.3 | (1) |
| 1.4 | (4) |
| 1.5 | (2) |
| 1.6 | (1) |
| 1.7 | (3) |

1.8 **පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම දෙකක්**

- විකුණුම්කරුට භාණ්ඩ විකිණීම සඳහා අයිතියක් තිබිය යුතුය. විකිණීමට එකඟ වීම සඳහා වන ගිවිසුමක දී නම් හිමිකම් පැවරෙන කාලයේ දී විකිණීමේ අයිතිය විකුණුම්කරුට තිබිය යුතුය. (13 වන වගන්තිය)
- විස්තරයට අනුව භාණ්ඩ විකිණීම සඳහා ගිවිසුමක් ඇතිවන අවස්ථාවක අදාළ භාණ්ඩ විස්තරයට අනුකූල විය යුතුය. භාණ්ඩ විස්තරයක් මගින් මෙන්ම සාම්පලයක් මගින් ද විකුණනු ලබන විට එම භාණ්ඩ විස්තරයට මෙන්ම සාම්පලයට අනුරූප විය යුතුය. (14 වන වගන්තිය)
- ගැනුම්කරු තමාට භාණ්ඩ අදාළ කාර්යය ව්‍යංගයෙන් හෝ ප්‍රකාශිතව විකුණුම්කරුට දන්වා ඇති විට එකී භාණ්ඩ ගැනුම්කරුගේ අවශ්‍යතාවට සුදුසු විය යුතුය. (15 (1) වන වගන්තිය)
- භාණ්ඩ වෙළෙඳ ගුණයෙන් යුක්ත විය යුතුය. (15 (2) වන වගන්තිය)
- සාම්පලයක් මගින් භාණ්ඩ විකුණන විට අදාළ භාණ්ඩ සාම්පලයට අනුකූල විය යුතුය. (16 වන වගන්තිය)

1.9 **පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම දෙකක්**

- සුරැකුම් වෙළෙඳපොළෙහි සංවර්ධනය පිළිබඳ රජයට උපදෙස් ලබාදීම.
- බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළ තුළ සුරැකුම්පත් පිළිබඳ කරුණු හා ලැයිස්තුගත කිරීම නියාමනය කිරීම.
- ලැයිස්තුගත කිරීමක් සඳහා ඉදිරිපත් කරන යම්කිසි අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළ අධීක්ෂණය කිරීම.
- බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළ බ්‍රෝකර්වරුන්ගේ, අලෙවි නියෝජිතයින්ගේ, සමාගම හා ඒකකභාරවල භාරකරුවෙකුගේ, ලැයිස්තුගත පොදු සමාගමක, ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ විභාග කිරීම හා පර්යේෂණය කිරීම.
- සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධව රාජ්‍ය වැඩසටහන් හා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම.

1.10 **පහත සඳහන් ඒවා අතුරෙන් ඕනෑම දෙකක්**

- විනිමය බිල්පත්
- අයකර ගැනීමේ එකඟතාවයන්
- ණයවර ලිපි
- විවෘත ගිණුම හරහා ගෙවීම
- අත්තිකාරම් ගෙවීම
- විද්‍යුත් වාණිජ්‍යය

SRI LANKA

**(මුළු ලකුණු 20)**

***A* කොටසෙහි අවසානය.**

**B කොටස**

අනිවාර්ය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| 06 වන පරිච්ඡේදය - හවුල් ව්‍යාපාර සහ සමාගම් නීතියේ මූලිකාංග |
|---|

දෙන ලද කරුණු අනුව පෙනී යන්නේ සොයිසා විසින් වට්ටම් සහිත මිලකට ලිපි ද්‍රව්‍ය මිලට ගෙන අනෙක් හවුල්කරු වන පෙරේරාගේ කිසිදු අනු දැනුමකින් තොරව ඒවා සාමාන්‍ය වෙළඳපොළ මිලට හවුල් ව්‍යාපාරය වෙත විකුණා රහස් ලාභ උපයා ඇති බවයි. සොයිසා විසින් නීතිය විසින් පිළිගන්නා හවුල්කරුවෙකු විසින් පිළිපැදිය යුතු පහත යුතුකම් උල්ලංඝණය කර ඇති බව පෙනී යයි.

- හවුල් ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් ගිණුම් හා සම්පූර්ණ තොරතුරු අනෙකුත් හවුල්කරුවන්ට හෙළිදරව් කිරීම. මෙම සිදුවීම සම්බන්ධයෙන් සලකා බලන කල මිලදී ගන්නා ලද ලිපි ද්‍රව්‍යවල සත්‍ය මිල හෙළිදරව් කිරීම
- හවුල් ව්‍යාපාරික සම්බන්ධතා භාවිතා කරමින් උපයන ලද සියලු ප්‍රතිලාභ පිළිබඳව සම්පූර්ණ විස්තර හෙළිදරව් කිරීම.

මේ සම්බන්ධව පහත නඩුවලදී ඉදිරිපත් කරන ලද මූලධර්ම වැදගත් වේ.

***Bentley* v *Craven*** (1853)

මෙම නඩුවේදී බී හා සී හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් වූහ. සී හවුල් ව්‍යාපාරය වෙනුවෙන් සීනි මිලදී ගැනීම් කටයුතු වල නිරත විය. සී වට්ටම් කරන ලද මිලකට සීනි මිලට ගෙන හවුල් ව්‍යාපාරයට වෙළඳපළ මිලට අලෙවි කොට රහස් ලාභයක් උපයන ලදී. කෙසේ නමුත් සී මෙම කරුණු බී වෙත හෙළිදරව් කළේ නැත. මෙම සිදුවීම සලකා බලූ අධිකරණය කියා සිටියේ ඉහත ගණුදෙණුවෙන් සී ලැබූ ලාභයෙන් කොටසක් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් ගිණුම්ගත කළ යුතු බවයි.

***Pathirana* v *Pathirana*** (1967)

මෙම නඩුවේදී පතිරන (පී1) හා පතිරන (පී2) යන අය මෝටර් රථ සේවා සපයන ව්‍යාපාරයක හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෝ වූහ. එක්තරා සමාගමකට අයත් වූ මෙම සේවා ස්ථානයේ නියෝජිතයන් වශයෙන් මෙම හවුල් ව්‍යාපාරය පත්කොට තිබුණි. (පී2) විසින් හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට මාස තුනක දැන්වීමක් ලබා දුන්නේය. එසේම එම කාලය අතරතුර (පී2) විසින් (පී1) ගේ දැනුවත්භාවයකින් තොරව සමාගම සමඟ (පී2) ගේ නමින් පමණක් නව ගිවිසුමක් ඇති කරගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා තිබුණි. හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමෙන් පසුව (පී2) සමාගම සමගින් පවත්වා ගෙන ආ ආකාරයෙන්ම සේවා ස්ථානය පවත්වාගෙන යනු ලැබීය. අධිකරණය ඒ සම්බන්ධයෙන් තීරණය කළේ නියෝජිත සම්බන්ධය හවුල් ව්‍යාපාරික වත්කමක් වීමත් එම වත්කම භාවිතා කොට (පී2) විසින් ලාභ උපයා තිබීමත් නිසා (පී2) විසින් නියෝජිත සම්බන්ධයෙන් ලබන්නා වූ ලාභයෙන් කොටසක් (පී1) වෙනුවෙන් ගිණුම්ගත කළ යුතු බවයි.

හවුල් ව්‍යාපාරික ගිවිසුම පැවැත්ම හෝ නොපැවැත්ම ඉහත දක්වන ලද මූලධර්ම හවුල් ව්‍යාපාරයකට අදාළ වීම කෙරෙහි කිසිදු බලපෑමක් ඇති නොකරයි.

ඉහත දක්වන ලද මූලධර්මයන් ප්‍රශ්නගත සිද්ධිමය කරුණු සඳහා ආදේශ කිරීමෙන් පෙනී යන්නේ සොයිසා විසින් ඉහතින් දක්වන සියලු මූලධර්ම උල්ලංඝණය කර ඇති බවයි. ඒ අනුව ඉහත අධිකරණ පූර්ව නිදර්ශනයන්හි දක්වා ඇති පරිදි පෙරේරාට, සොයිසා ලැබූ ලැබූ රහස් ලාභයෙන් ඔහුට අයත් කොටස අයකර ගැනීමට අයිතියක් ඇත.

(ලකුණු 05)

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| 11 වන පරිච්ඡේදය - ව්‍යාපාර ආචාර ධර්ම |
|---|

**සංවිධානයක් තුළ ගණකාධිකාරීවරයෙකු මුහුණ දෙන ආචාරධර්මීය ගැටළු**

- කළමණාකරණයෙන් එල්ලවන පීඩනය
- අනාවරණය කරගන්නා ලද උල්ලංඝණයන් වාර්තා කිරීම
- යහපත් ජීවන තත්වයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය
- මූල්‍ය වාර්තා මග හැරීම
- ආචාරධර්ම කෙරෙහි ඇති සංවේදීතාවයේ අඩුකම

**(ලකුණු 05)**

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| 09 වන පරිච්ඡේදය - අන්තර්ජාතික වෙළඳාම |
|---|

**නෞභාර පත්‍රය**

නැව් සමාගමක් විසින් යම් නිශ්චිත භාණ්ඩ තොගයක් එක් වරායක සිට තවත් වරායකට ප්‍රවාහනය කර දීමට එකඟ වෙමින් අපනයනකරු වෙත නිකුත් කරනු ලබන ලියවිල්ල නෞභාර පත්‍රය ලෙස හැඳින්වේ. නෞභාර පත්‍රයක් මගින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

- **නැව්ගත කළ භාණ්ඩ සඳහා කුවිතාන්සියක් ලෙස ක්‍රියා කිරීම**

  සාමාන්‍යයෙන් නෞභාර පත්‍රයක නැව්ගත කළ භාණ්ඩවල ප්‍රමාණය, තත්ත්වය සහ හඳුනා ගැනීමේ ලක්ෂණ සඳහන් වේ. ඒ අනුව නැව් සමාගම නෞභාර පත්‍රයේ සඳහන් භාණ්ඩ ප්‍රමාණය එහි සඳහන් ගුණත්වයෙන් ප්‍රවාහනය කර දීමට වගකීමෙන් බැඳේ.

- **මුහුදෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ගිවිසුමක් අපනයනකරු හා නැව් සමාගම් අතර ඇති බවට සාක්ෂියක් වීම**

  සාමාන්‍යයෙන් අදාළ බිල්පත් නිකුත් කිරීමට පෙරාතුව පාර්ශ්වයන් අදාළ ගිවිසුම්වලට එළඹෙයි. එම හේතුවෙන් නැව්ගත කරන්නා සහ භාණ්ඩ ගෙනයන්නා අතර ඇති ගිවිසුම පිළිබඳ සාක්ෂියක් ලෙස මෙය හඳුනාගත හැකිය.

- **නැව්ගත කරන ලද භාණ්ඩවල හිමිකම පිළිබඳ ලියවිල්ලක් වශයෙන් කටයුතු කිරීම**

  ආනයනකරුගේ වරායේ දී නෞභාර පත්‍රයෙහි මුල් පිටපත ඉදිරිපත් කිරීමෙන් පමණක් භාණ්ඩ නිදහස් කරගැනීමේ හැකියාව ලැබේ. තව දුරටත් භාණ්ඩ වරායට ළඟා වීමට ප්‍රථම නෞභාර පත පිටසන් කිරීම තුළ භාණ්ඩ පැවරීම සිදු කළ හැකි වේ.

- **ආනයනය කරන ලද භාණ්ඩවලට හානියක් සිදු වූ අවස්ථාවක දී වන්දි ලබාගැනීම සඳහා උපකාරී වීම**

***(කාර්යයන් තුනක් පැහැදිලි කිරීම අපේක්ෂා කෙරේ.)***

**(ලකුණු 05)**

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

05 වන පරිච්ඡේදය - නියෝජ්‍යත්ව නීතිය

ප්‍රධානියා හා නියෝජිතයා අතර සම්බන්ධතාවය පහත ආකාරයන්ගෙන් නිර්මාණය වේ.

- **ප්‍රකාශිතව නියෝජ්‍යත්වය පැන නැගීම**

  ප්‍රකාශිතව නියෝජ්‍යත්වය පැන නැගීමේ දී, ප්‍රධානියා නියෝජිතයාට ප්‍රකාශිතවම තමන් වෙනුවෙන් තුන්වන පාර්ශ්වයක් සමග ගිවිසුමකට එළඹීමට බලය ලබාදෙයි. ප්‍රකාශිතව නියෝජිතයෙකු පත් කිරීම සම්බන්ධයෙන් නීතිය මගින් නියම කරන ලද විධිමත්භාවයන් නොමැති බැවින් ප්‍රකාශිත බලය ලිඛිතව හෝ වාචිකව ලබාදීම සිදු කළ හැකිය.

- **ව්‍යංග නියෝජ්‍යත්වය පැන නැගීම**

  නියෝජ්‍යත්වයේ දී, ප්‍රධානියා විසින් නියෝජිතයාව කිසියම් තනතුරකට පත් කරයි. උදාහරණ වශයෙන් කළමනාකරු, කළමනාකාර අධ්‍යක්ෂ, තැරැව්කරු, වෙන්දේසිකරු යනාදී වශයෙනි. එවන් නියෝජිතයෙකුට එකී තනතුරේ කටයුතු කිරීම සඳහා නිතැතින් ම අවශ්‍ය වන්නා වූ බලයක් තිබේ. එම බලය සත්‍ය බලය / නියම බලය වශයෙන් හඳුන්වනු ලැබේ.

  යම් නියෝජිතයෙකු විසින් එකී සත්‍ය බලය භාවිතා කරමින් කටයුතු කරන විට පැන නගින නියෝජ්‍යත්වය ව්‍යංග නියෝජ්‍යත්වයයි.

<u>නඩු තීන්දු</u>

  *<u>Hely-Huchinson</u>* V *<u>Brayhead Ltd</u>*

- **ප්‍රතිබන්ධනයෙන් නියෝජ්‍යත්වය පැන නැගීම**

  ප්‍රතිබන්ධන රීතියේ බලපෑම හේතුකොටගෙන පැන නගින්නා වූ නියෝජ්‍යත්වය ප්‍රතිබන්ධන නියෝජ්‍යත්වයයි. ප්‍රතිබන්ධන නියෝජ්‍යත්වයෙන් ප්‍රකාශ වන්නේ යමෙකු කිසිවක් ප්‍රකාශිතව හෝ ව්‍යංගයෙන් සඳහන් කර ඇති විට පසුව එසේ නොවේ යැයි කියා සිටීමෙන් වළක්වනු ලබන බවයි. ඒ අනුව යමෙකු විසින් තවත් පුද්ගලයෙකු තම නියෝජිතයා ලෙස තුන්වන පාර්ශ්වයකට හඳුන්වා දී ඇත්නම් පසු අවස්ථාවක දී ඔහු සත්‍ය නියෝජිතයා නොවුණ ද නියෝජ්‍යත්ව සම්බන්ධතාවක් ප්‍රතික්ෂේප කිරීමට ප්‍රධානියාට හැකියාවක් නොපවතී.

<u>නඩු තීන්දු</u>

  *<u>Freeman & Lockyer</u>* V *<u>Buckhurt Park Properties Ltd</u>*

- **අපරානුමැතියෙන් නියෝජ්‍යත්වය පැන නැගීම**

  සාමාන්‍ය රීතියක් වශයෙන් ප්‍රධානියා විසින් නියෝජිතයා වෙත කලින් ප්‍රකාශිතව දෙන ලද බලයක් නොමැතිව නියෝජිතයෙකු කටයුතු කර ඇති විටෙක නියෝජ්‍යත්වය පැන නොනගී. එහෙත් ප්‍රධානියා යැයි කියන පුද්ගලයා විසින් පසුව අනුමැතිය දෙනු ලැබුවහොත් අපරානුමැතියෙන් නියෝජ්‍යත්වය පැන නැගේ. අපරානුමැතිය ලිඛිතව, වාචිකව හෝ ව්‍යංගයෙන් සිදු කළ හැකි වේ. කෙසේ නමුත් හුදු අනුමැතිය ලබාදීමක් වලංගු අපරානුමැතියක් නොවන අතර වලංගු අපරානුමැතියක් ඇති වීම සඳහා නීතිය මගින් නියම කළ අවශ්‍යතාවන් රැසක් සම්පූර්ණ කළ යුතුය.

- **අවශ්‍යතාව මත නියෝජ්‍යත්වය පැන නැගීම**

  යම් හදිසි අවස්ථාවක යමෙකු (නියෝජිතයා) තවත් අයෙකු (ප්‍රධානියා) වෙනුවෙන් කටයුතු කර ඇත්නම් එවැනි අවස්ථාවක දී අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වය පැන නගී. අවශ්‍යතාව මත නියෝජ්‍යත්වය ඇති වීමේ දී පහත කරුණු සම්පූර්ණ විය යුතුය.

  - ප්‍රධානියාගෙන් උපදෙස් ලබාගත නොහැකි තරමේ හදිසි අවශ්‍යතාවන් උද්ගතව තිබිය යුතුය.
  - එය සත්‍ය වාණිජමය අවශ්‍යතාවන් විය යුතුය.
  - නියෝජිතයා විසින් ප්‍රධානියා වෙනුවෙන් සද්භාවයෙන් ක්‍රියා කොට තිබිය යුතුය.

- නියෝජිතයා විසින් ගන්නා ලද පියවර සාධාරණ හා විචක්ෂණශීලී විය යුතුය.

- ප්‍රධානියා විසින් පටහැනි ආකාරයේ ප්‍රකාශිත උපදෙස් පූර්වයෙන් ලබා දී නොතිබිය යුතුයි.

නඩු තීන්දු

***G.N.Railway V Swa field***

*(ආකාර තුනක් පැහැදිලි කිරීම අපේක්ෂා කෙරේ.)*

**(ලකුණු 05)**

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| 04 වන පරිච්ඡේදය - ගණුදෙණු කළ හැකි සාධන පත්‍ර |
|---|

විනිමය බිල්පත් ආඥා පනතේ 29 (1) වගන්තියේ දක්වා ඇති පරිදි, යථාකාල ධාරකයෙකු ලෙස සැලකීම සඳහා පහත අවශ්‍යතාවන් සම්පූර්ණ කළ යුතුය.

- **බිල්පත, එහි මුහුණතෙහි සඳහන් කරුණු අනුව සම්පූර්ණ හා විධිමත් විය යුතු වීම**
  නිදර්ශනයක් වශයෙන් බිල්පතෙහි දිනය යොදා නැත්නම් හෝ මුදල් ගණන අන්තර්ගත කර නැත්නම්, අත්සන් කර නැත්නම් හෝ පිටසන් කර නැත්නම්, එය සම්පූර්ණ බිල්පතක් වන්නේ නැත. එසේ වන විට දී, වලංගු යථාකාලධාරකයෙකුගේ පැවැත්මක් ද නැත.
- **ධාරකයා විසින් බිල්පත කල් ඉකුත් වීමට (Over due) ප්‍රථමව ලබාගත යුතු වීම**
  කාලසීමා බිල්පතක (Term Bill) කල් පිරීමේ දිනය (Maturity date) ඉක්මවා යාමෙන් අනතුරුව, එය කල් ඉකුත් වේ. ඉල්ලූ විට ගෙවන බිල්පතක් (Demand Bill) සාධාරණ කාලසීමාවකට පසුව කල් ඉකුත් වේ. මාස 06 කාලයකට පසුව චෙක්පතක් කල් ඉකුත් වේ. යම් බිල්පතක් කල් ඉකුත් වීමෙන් පසුව කිසිදු ධාරකයෙකුට එය දරා සිටිය නොහැකිය.
- **අදාළ බිල්පත පිළිබඳව පූර්වයෙන් සිදු වූ අගරු කිරීමක් තිබේ නම්, එවැනි අගරු කිරීමක් පිළිබඳව ධාරකයාට දැනුම් දී නොතිබිය යුතුය.**
  යම් බිල්පතක් නොගෙවා සිටීම (non-payment) හෝ ප්‍රතිග්‍රහණය නොකිරීම (non-acceptance) මත එම බිල්පත අගරු විය හැකිය. වලංගු යථාකාල ධාරකයෙකු වීමට නම්, එකී පූර්ව අගරු කිරීම (dishonour) පිළිබඳව දැනුමක් නොතිබිය යුතුය.
- **ධාරකයා සද්භාවයෙන් (good faith) යුතුව බිල්පත ලබාගෙන තිබිය යුතුවීම**
  බිල්පතෙහි ධාරකයාට, එය සොරකම් කරන ලද්දක් බවට වන කරුණු පිළිබඳව අවබෝධයක් තිබේ නම්, එවැනි ධාරකයෙකු 'යථාකාලීන ධාරකයෙකු' බවට පත්වන්නේ නැත.
- **ධාරකයා විසින් ම බිල්පතෙහි වටිනාකම ලබාදී තිබිය යුතු වීම**
  ශ්‍රී ලංකාව තුළ විනිමය බිල්පත් සම්බන්ධයෙන් ඉංග්‍රීසි නීතිය අදාළ වේ. බිල්පතක් සඳහා ප්‍රතිෂ්ඨාවක් පැවතීම අනිවාර්ය අවශ්‍යතාවක් වේ. ඒ අනුව තෑගි දෙන ලද, සොරකම් කරන ලද හෝ අහුලා ගන්නා ලද බිල්පතක් සම්බන්ධයෙන් යථාකාල ධාරකයෙකුගේ පැවැත්මක් නොමැත.
- **ධාරකයා හට බිල්පත ගනුදෙනු කරන (Negotiate) අවස්ථාවේ දී, ඔහුට එම පැවරුම්කරුගේ කළ පුද්ගලයාගේ හිමිකමෙහි තිබූ දෝෂ පිළිබඳව කිසිදු දැනීමක් නොතිබිය යුතුය.**

*(කරුණු තුනක් පැහැදිලි කිරීම අපේක්ෂා කෙරේ.)*

**(ලකුණු 05)**

***B* කොටසෙහි අවසානය.**

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 7 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| 08 පරිච්ඡේදය - රක්ෂණ නීතිය, කුලී සින්නක්කර ගිවිසුම් හා කල්බදු |
|---|

a) රක්ෂණ ගිවිසුමක් රක්ෂණ හිමිකමකින් තහවුරු විය යුතුය. යම්කිසි විෂය වස්තුවක් රක්ෂණය කිරීමට රක්ෂිතයාට ඇති නිත්‍යානුකූල අයිතිය රක්ෂණ හිමිකමයි. යම් රක්ෂණ ගිවිසුමක් රක්ෂණ හිමිකම මගින් තහවුරු නොවන්නේ නම් පාර්ශ්වයන් අතර වලංගු රක්ෂණ ගිවිසුමක් පවතින්නේ නැත. යම් විෂය වස්තුවක් සම්බන්ධයෙන් යම් පුද්ගලයෙකුට රක්ෂණ හිමිකමක් ඇති වීමට නම් එකී පුද්ගලයාට එකී විෂය වස්තුව පැවතීමෙන් මූල්‍යමය වාසියකුත් එකී විෂය වස්තුව විනාශ වීමෙන් මූල්‍යමය අවාසියකුත් සිදු විය යුතුය.

ප්‍රශ්නගත සිදුවීමේදී මායා, තමාට රුපියල් මිලියනයක් අය වීමට ඇති කසුන්ගේ ජීවිතය සඳහා ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීමට ඇති හැකියාව සලකා බලමින් සිටී. එහිදී මායා රක්ෂිතයා වන අතර කසුන්ගේ ජීවිතය රක්ෂණ ගිවිසුමෙහි විෂය වස්තුව බවට පත් වේ. ඒ අනුව මායාට විෂය වස්තුව වන කසුන්ගේ ජීවිතය පිළිබඳව ඔවුන් අතර පවත්නා සම්බන්ධතාවයේ ස්වරූපය අනුව රක්ෂණ හිමිකමක් පවතීද යන්න විමසා බැලිය යුතුය.

***<u>Dalby</u> V <u>India and London Life Assurance Company</u>*** නඩුවේදී අධිකරණය තීරණය කරන ලද්දේ ණය හිමියෙකුට ණයගැතියෙකුගේ ජීවිතය සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් පවතින බවයි. ඒ අනුව මායාට සිය ණය ගැතියා වන කසුන්ගේ ජීවිතය ආවරනය වන පරිදි ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීමේ හැකියාවක් පවතී.

b) සියලුම රක්ෂණ ගිවිසුම් උපරිම විශ්වාසය (Uberrimae fidei) මත පදනම් වන ගිවිසුම් වේ. ඒ අනුව රක්ෂණ ගිවිසුමක පාර්ශවකරුවන්, අනෙකුත් පාර්ශවය ගිවිසුමට එළඹෙන්නේද නැද්ද යන කාරණය හෝ ගිවිසුමේ වාරික මුදල තීරණය කිරීමට බලපෑම් කරනු ලබන කරුණු අනෙක් පාර්ශවයට ස්වෙච්ඡාවෙන් හෙළිදරව් කිරීමට බැඳී සිටී. මෙම මූලධර්මය හරහා රක්ෂණ ගිවිසුමක පාර්ශවකරුවන්ගේ සත්‍යවාදීත්වය තහවුරු කරනු ලබයි. රක්ෂණ ගිවිසුමක වැදගත් කරුණක් එක් පාර්ශවයක් විසින් හෙලිදරව් කිරීමට අසමත් වීම එකී රක්ෂණ ගිවිසුම හිස් ගිවිසුමක් බවට පත්වීමට හේතු වේ.

සිද්ධිගත කරුණු අනුව පෙනී යන්නේ සේන විසින් සිය ජීවිතය ආවරණය කරමින් ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීමේදී ඔහුගේ සෞඛ්‍ය තත්වය සහ ඔහු මුහුණ දුන් ශෛල්‍යකර්මය පිළිබඳව රක්ෂණ සමාගම වෙත කරුණු හෙළිදරව් කර නොමැති බවයි. එම කරුණු හෙලිදරව් කිරීමට අපොහොසත් වීම උපරිම විශ්වාසය කඩ කිරීමක් ලෙස සැලකිය හැකිය.

ඒ අනුව රක්ෂණ සමාගමට වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම යන පදනමේ පිහිටා රක්ෂණ වගකීම ප්‍රතික්ෂේප කිරීමටත් එම ප්‍රතික්ෂේප කිරීම රක්ෂණ නීති මූලධර්ම මත සාධාරණීකරණය කළ හැකි බවත් පෙනී යයි.

නඩු තීන්දු

***<u>Looker</u> V <u>Law Union Insurance Company</u>***

(මුළු ලකුණු 10)

# 8 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| 07 වන පරිච්ඡේදය - කම්කරු නීතිය |
|---|

a) පහත ඒවා අතුරෙන් ඕනෑම තුනක්

- **පාලනය පිළිබඳ පරීක්ෂණය**

  පාලනය පිළිබඳ පරීක්ෂණයට අනුව සේවායා හට ගිවිසුමට අදාළ අනෙක් පාර්ශ්වය වෙත මොනවා කළ යුත්තේ ද පමණක් නොව කෙසේ අදාළ කාර්යය කළ යුත්තේ ද යන්න පිළිබඳවත් උපදෙස් දීමේත් හැකියාව ඇත්නම් අනෙක් පාර්ශ්වය ඔහුගේ සේවකයෙකු ලෙස තීරණය කරනු ලබයි.

- **උපකරණ පිළිබඳ පරීක්ෂණය**

  යම්කිසි පුද්ගලයෙකු අදාළ කාර්යය ඉටු කිරීමට අවශ්‍ය සියලු භාණ්ඩ ඔහු විසින් ම රැගෙන ඒ නම් ඔහු නිදහස් සේවක ගිවිසුම්කරු වෙයි. නමුත් සියලු අවශ්‍ය උපකරණ සේවායා විසින් සපයනු ලබයි නම් අදාළ සේවය ලබාදෙන පුද්ගලයා ස්ථිර සේවකයෙකු වේ.

- **ඒකාබද්ධතා පරීක්ෂණය**

  ඒකාබද්ධතා පරීක්ෂණය තුළින් සිදුවන්නේ අදාළ සේවකයා අදාළ සේවා ස්ථානයට කොපමණ ඒකා-බද්ධ වී ඇත්ද යන්න සොයා බැලීමයි. අදාළ සේවකයා තාවකාලික, සාමාන්‍ය සේවකයෙකු නොවී අදාළ සේවා ස්ථානයේ ම කොටසක් ලෙස, අත්‍යවශ්‍ය සේවකයෙකු ලෙස කටයුතු කරයි නම්, ඔහු අදාළ සේවා ස්ථානයට ඒකාබද්ධ සේවකයෙකු ලෙස සැලකේ.

- **ආර්ථික යථාර්ථය පිළිබඳ පරීක්ෂණය**

  ආර්ථික යථාර්ථය පිළිබඳ පරීක්ෂණයේ දී යම් පුද්ගලයෙකු තවකෙකු වෙනුවෙන් වැඩ කරයි නම් ඔහු සේවකයෙක් ලෙස සැලකෙන අතර යමෙකු ඔහු වෙනුවෙන් ම කටයුතු කරයි නම් ඔහු නිදහස් සේවා ගිවිසුම්කරුවෙකු ලෙස සැලකේ.

- **මිශ්‍ර පරීක්ෂණය**

  මෙහිදී ඉහත දක්වන ලද පරීක්ෂණ සියල්ල එකවර යොදාගනු ලබයි.

**නඩු තීන්දු**

***<u>Sri Lanka Insurance Corpoation</u> Vs. <u>A.C.R. Wijesundara</u>***

**(ලකුණු 06)**

b) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත මගින් ප්‍රකාශිතවම බැහැර කරන ලද සේවකයින් හැර අන් සෑම සේවකයෙකුටම ඔහුගේ හෝ ඇයගේ රැකියාව නතර කිරීමෙන් පසු පාරිතෝෂික ලැබීම සඳහා හිමිකමක් ඇත. තවද පාරිතෝෂික ගෙවීම සඳහා හිමිකම් ලැබීමට සේවකයෙකු එකම සේවායෝජකයා සමඟ වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුය.

යම් සේවකයෙකු හිමිකම් ලබන පාරිතෝෂිකය ඔහු ලැබූ අවසන් මස වැටුපෙන් අඩක් ඔහු විසින් සේවා යෝජකයා සමඟ සම්පූර්ණ කරන ලද කාලපරිච්ඡේදයෙන් ගුණ කිරීමෙන් ගණනය කළ හැකිය.

$$\textbf{පාරිතෝෂිකය} = \frac{\textbf{අවසාන මාසයේ වැටුප}}{\mathbf{2}} \times \textbf{සම්පූර්ණ කරන ලද වසර ගණන}$$

$$4,500,000 = \frac{500,000}{2} \times 18$$

**ඒ අනුව චන්මුගම්ට රුපියල් 4,500,000 ක පාරිතෝෂිකයක් සඳහා හිමිකම් කිව හැකිය.**

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

## 9 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

10 වන පරිච්ඡේදය - ව්‍යාපාර පරිසරයට අදාළ වැරදි සහ නව රෙගුලාසි

a) මුදල් විශුද්ධිකරණ පනතේ නීති විරෝධී ක්‍රියාකාරකම් යන්නෙන් මෙහි පහත සදහන් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන ක්‍රියාවක් අදහස් වේ.

- විෂ ද්‍රව්‍ය, අබිං සහ අන්තරාදායක ආයුධ පනත
- ත්‍රස්තවාදය වැළැක්වීමට අදාළව බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- අල්ලස් පනත
- ගිනි අවි, පුපුරන ද්‍රව්‍ය හෝ අන්තරාදායක ආයුධ පනත
- විනිමය පාලන පනත
- අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- සයිබර් අපරාධ සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- ළමුන්ට එරෙහි වැරදි හා පුද්ගල ජාවාරම් සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- මරණීය දණ්ඩනයෙන් හෝ අවුරුදු හතකට වඩා වැඩි කාලයක් සිර දඬුවම් පැණවිය හැකි යම් වරදක් සංයුක්ත වන නීතියක්

(ලකුණු 05)

b) i) **ලකුණු**

ලකුණක් යනු එක් ව්‍යාපාරයක භාණ්ඩ හෝ සේවාවලින් තවත් ව්‍යාපාරයක භාණ්ඩ හෝ සේවා වෙන් කොට හඳුනාගත හැකි දෘශ්‍ය ලකුණකි. එය, වචනයක්, ආදර්ශ පාඨයක්, නමක්, අක්ෂර සමූහයක්, සංකේතයක්, මෝස්තරයක්, පින්තූරයක්, උක්ත ඕනෑම සංයුතියක්, ශබ්දයක් හෝ භාණ්ඩ ඇසුරුම් ක්‍රමයක් විය හැකිය.

භාණ්ඩ විකිණීම ආශ්‍රිතව වන ලකුණක් 'වෙළෙඳ ලකුණක්' ලෙසට ද සේවා සැපයීම ආශ්‍රිතව වන ලකුණක් 'සේවා ලකුණක්' ලෙස ද හඳුනා ගනියි.

ii) **වෙළඳ නාම**

යම් ස්වභාවික පුද්ගලයෙකුගේ හෝ නෛතික පුද්ගලයෙකුගේ ව්‍යාපාරයක් හැඳින්වීම සඳහා යොදා ගනු ලබන නාමයක් ලෙස හඳුනා ගත හැකිය. මහජන සදාචාරයට එරෙහි වන්නාවූ, ආගම් විවේචනය කරන්නාවූ, ජාතිවාදය අවුළුවන්නා වූ හෝ මහජනයා නොමඟ යවන්නා වූ වෙළඳ නාමයන් ලියාපදිංචි කළ නොහැක.

(ලකුණු 05)

(මුළු ලකුණු 10)

**C කොටසෙහි අවසානය.**

**D කොටස**

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| 02 වන පරිච්ඡේදය - ගිවිසුම් නීතිය |
|---|

**(A)** කොටස

**(a)** මෙය ගිවිසුම් නීතිය මත පදනම් වේ. නෛතික සම්බන්ධතාවයක් ඇති කර ගැනීමේ අදහසින් පාර්ශවයන් අතර ඇති වන්නා වූ එකඟතාවයක් ගිවිසුමක් ලෙස අර්ථ ගැන්විය හැකිය. අර්පණය වලංගු ගිවිසුමක වැදගත් මූලිකාංගයකි. වලංගු අර්පණයක් නොමැති තැන වලංගු ගිවිසුමක් ඇති නොවේ.

අර්පණය, ''අර්පණය සඳහා ආරාධනා කිරීමකින්'' වෙන්කොට හඳුනා ගත යුතුය. මන්දයත් අර්පණය සඳහා ආරාධනා කිරීමකින් වලංගු ගිවිසුමක් ඇති නොවන බැවිනි.

ගිවිසුමක් සම්බන්ධයෙන් පාර්ශවකරුවන් සාකච්ඡා කිරීමට ඇති කැමැත්ත ප්‍රකාශ කිරීමක් අර්පණය සඳහා ආරාධනා කිරීමක් වශයෙන් හඳුනා ගත හැකිය.

අධිකරණය විසින් තීරණය කරන ලද නඩු තීන්දු මාලාවක් ඔස්සේ අර්පණය සඳහා ආරාධනා කිරීම් ගැන උදාහරණ සපයා ඇත.

- වෙළඳ දැන්වීම් ***(Harris V Nikerson , Partridge v Crittenden)***
- වෙන්දේසි ***(Payne v Cave)***
- ටෙන්ඩර් කැඳවීම ***(Spencer v Harding)***
- විකිණීම සඳහා භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම ***(Fisher V Bell , Crawly v Rex)***
- සංස්ථා ප්‍රකාශ
- දැන්වීම් පල කිරීම

ඒ අනුව පෞරාණික බඳුන් විකුණුම්කරු විසින් පෞරාණික බඳුන් අලෙවිය සඳහා වෙන්දේසියක් පවත්වන බවට පල කරන ලද දැන්වීම අර්පණයක් වශයෙන් හඳුනාගත නොහැකිය. එබැවින් දසුන් සහ පෞරාණික බඳුන් අලෙවිකරු අතර බන්ධනීය ගිවිසුමක් ඇති වී නොමැත. දසුන්ට සංචාරය අවලංගු කිරීම නිසා දැරීමට සිදු වූ පිරිවැය සහ ගාල්ලේ සිට කොළඹට පැමිණීමට දරන්නට සිදු වූ පිරිවැය වෙන්දේසිකරුගෙන් අයකරවා ගැනීමට නෛතිකමය අයිතිවාසිකම් නොපවතී.

(ලකුණු 08)

(b) මෙය ගිවිසුම් නීතිය මත පදනම් වේ. සාරා සහ සංචාරක නියෝජිත ආයතනය අතර යුරෝපයේ සංචාරයක් සඳහා ගිවිසුමක් ඇතිකරගෙන ඇත.

කෙසේ නමුත්, සංචාරක නියෝජිත ආයතනය විසින් සපයන ලද ගුවන් ගමන් පහසුකම ගිවිසුම යටතේ සාරා සමඟ එකඟ වූ ව්‍යාපාරික පන්තියේ පහසුකමක් නොවන අතර නවාතැන් පහසුකමද ඇය සමඟ එකඟ වූ නගර මධ්‍යයේ සිට මීටර් 500 ක් තුළ පිහිටි තරු පන්තියේ නවාතැන් පහසුකමක් නොවේ.

සංචාරක නියෝජිත ආයතනය විසින් සිදු කරන ලද මෙම නොකරහැරීම් ගිවිසුම කඩ කිරීමක් වශයෙන් හඳුනාගත හැකිය. මන්දයත් එකී නොකරහැරීම් තුළ සාරා සමඟ ඇති කර ගන්නා ලද එකඟතාවයේ

සඳහන් වූ ප්‍රකාශිත වගන්ති සමග අනුගත වීමට සංචාරක නියෝජිත ආයතනය අසමත් ව ඇති බැවිනි. මෙකී තත්වය යටතේ සාරාට ගිවිසුම් කඩකිරීම යටතේ සංචාරක නියෝජිත ආයතනයෙන් සහන ලබා ගත හැකිය. ගිවිසුම් නීතිය යටතේ ගිවිසුමක් කඩ වූ අවස්ථාවකදී අහිංසක පාර්ශවයට පහත සඳහන් ප්‍රතිකර්ම හිමි වේ.

- වන්දි ලබා ගැනීම
- නියත ඉටු කිරීමේ ආඥාවක් ලබා ගැනීම
- තහනම් ආඥා ලබා ගැනීම
- ගිවිසුම තවදුරටත් ඉටු කිරීම ප්‍රතික්ෂේප කිරීම

කෙසේ නමුත් දෙන ලද කරුණු සලකා බැලීමේදී, සාරා දැනටමත් ඇයගේ සංචාරය නිමා කොට ඇති බැවින් ඇයට පවතින සුදුසුම විකල්පය වනුයේ ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් සංචාරක නියෝජිත ආයතනයෙන් වන්දි ඉල්ලා සිටීම බව පෙනී යයි. ඒ අනුව සාරාට සංචාරක නියෝජිත ආයතනය විසින් ගිවිසගත් ව්‍යාපාරික පන්තියේ ආසන පහසුකම ලබා නොදීම හා නවාතැන් පහසුකම් ලබා නොදී ගිවිසුම කඩ කිරීම නිසා දරන්නට සිදු වූ අලාභ සලකා බලමින් වන්දි ගණනය කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටිය හැක.

**(ලකුණු 10)**

**(B)** කොටස

| 03 වන පරිච්ඡේදය - භාණ්ඩ විකිණීමේ නීතිය |
|---|

මෙය භාණ්ඩ විකිණීමේ අඥා පනතේ ව්‍යංග කොන්දේසි මත පදනම් වේ.

භාණ්ඩ විකිණීමේ අඥා පනතේ 13 වන වගන්තිය අනුව භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් සම්බන්ධයෙන් වන විටක ගිවිසුමට එළඹෙන අවස්ථාවේදීද, භාණ්ඩ විකිණීම සඳහා එකගවීමේ ගිවිසුමකදී භාණ්ඩ වල හිමිකම පැවරෙන අවස්ථාවේදීද විකුණුම්කරුට භාණ්ඩ විකිණීම සඳහා අයිතියක් පැවතිය යුතුය. යම් හෙයකින් විකුණුම්කරු මෙම ව්‍යවස්ථාපිත ව්‍යංග කොනදේසියට අනුගත වීමට අපොහොසත් වීම භාණ්ඩ විකිණීමේ ගිවිසුම උල්ලංඝණය කිරීමක් ලෙස සැලකේ.

***Rowland* V *Divall***, නඩුවේදී මෙම නීති තත්වය පිලිබඳව සාකච්ඡා කොට ඇත.

මෙම නඩුවේ දී Rowland නමැත්තා Divall නමැත්තාගෙන් මෝටර් රියක් මිලදී ගෙන මාස 04ක් පුරා පාවිච්චි කළේය. Divall විසින් තර්ක කරන ලද්දේ Rowland විසින් කාරය මාස 04ක් භාවිත කළ බැවින් එකී කාලය සඳහා මුදලක් අඩු කළ යුතු බවයි. එහෙත්, අධිකරණය තීරණය කළේ මාස 04ක කාලය නොසලකා මුළු මුදලම ලබා ගැනීමට Rowland ට අයිතියක් ඇති බවයි. එනම්, Divall ගිවිසුමේ ව්‍යංග කොන්දේසියක් වන 13(1) වගන්තියට අනුගත විධිවිධාන කඩ කර ඇති බවත්, එම නිසා ගිවිසුම අවලංගු වන බවත්ය.

ප්‍රශ්නගත සිදුවීමේ දක්වන ලද කරුණු ඉහත සඳහන් නඩුවේ කරුණු හා බොහෝ දුරට සමාන වන හෙයින්. එය මූලාශ්‍ර කරගනිමින් ප්‍රකාශ කළ හැක්කේ ඩේවිඩ් භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යංග කොන්දේසි උල්ලංඝණය කර ඇති බවයි. මන්දයත් සොරකම් කරන ලද කාරයක් විකිණීම තුළ, එකී භාණ්ඩය විකුණන ලද අවස්ථාවේදී ඩේවිඩ්ට මෝටර් රථය විකිණීමට අයිතියක් නොපවතින බැවිනි. ඒ අනුව ඩේවිඩ්, රොනාල්ඩෝ විසින් ගෙවන ලද සම්පුර්ණ මුදල ආපසු ගෙවීමට වගකීමෙන් බැඳේ.

**(ලකුණු 06)**
**(මුළු ලකුණු 25)**

***D* කොටසෙහි අවසානය.**

***Notice :***

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".

The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2020 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*

*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*